# මහනුවර තදාශ්‍රිතයේ පවත්නා බ්‍රිතාන්‍ය ගොඩනැගිලි වාස්තු විද්‍යාත්මක අධ්‍යයනයක්. (ගොඩනැගිලි හතරක් ඇසුරින් )

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

*ඕ. පී. නදීෂා දර්ශනී* [1]

මාලිංග අමරසිංහ [2]

**සංක්ෂේපය**

උඩරට බ්‍රිතාන්‍යයන්ට යටත්විජිතයක් බවට පත් වීමත් සමගින් සමාජ, ආර්ථික, දේශපාලනික හා ආගමික වශයෙන් උඩරට සමාජ ව්‍යුහය වෙනස් වන්නට විය. ඔවුහු සිය අභිලාශය උඩරැටියනට පෙන්වීමේ එක් මාර්ගයක් වශයෙන් සිය වාසස්ථාන ඉදිකිරීම් ද උපයෝගී කරගත්හ. එංගලන්තයේ පැවති ගොඩනැගිලි ආකෘතීන් අනුව ඒවා වෙනස් කරමින් බ්‍රිතාන්‍යයෝ නව ආකෘතීන් උඩරට පැවති භූමි අලංකරණයන් හා අමුද්‍රව්‍ය භාවිතයන් ද වෙනස් කරමින් නව සම්ප්‍රදායයක් හඳුන්වා දෙන්නට වූහ. එම නව ක්‍රමෝපායයන් පැවතියා වූ ගොඩනැගිලිවලට ද සුසංයෝග වන්නට විය. එමෙන් ම එතුළින් බ්‍රිතාන්‍යයෝ සිය අභිලාශය පෙන්වීමටද උත්සුක වූහ. ඒ අනුව උඩරට වාස්තු විද්‍යාත්මක ලක්ෂණ පෙන්නුම් කෙරෙමින් සිය අනන්‍යතාව රැකගනිමින් උඩරට පැවති ගොඩනැගිලි වල අනන්‍ය වාස්තු විද්‍යාත්මක ලක්ෂණ බිඳ හෙළීමටත්, නව වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හඳුන්වා දීමටත් බ්‍රිතාන්‍යයෝ සමත් වූහ. එම වාස්තු විද්‍යාත්මක අනන්‍යතා මොනවාද යන්න අධ්‍යයනය සඳහා මා විසින් මහනුවර තදාශ්‍රිතයේ ක්වීන්ස් හෝටලය, පැරණි කච්චේරි ගොඩනැගිල්ල, ශාන්ත පාවුළු දේවස්ථානය, පැරණි තැපැල් කාර්යාල ගොඩනැගිල්ල ආදී වශයෙන් අනුපිළිවෙළින් සටහන් තබනු ලබයි. එම ගොඩනැගිලි හතර තුළ පවත්නා සුවිශේෂ වාස්තු විද්‍යාත්මක අංග කිහිපයක් අධ්‍යයනයට බඳුන් වනු ඇත. එනම්, ගොඩනැගිලිවල බාහිර ඉදිකිරීම් ස්වරූපය, පියසි නිර්මාණය, ගෙබිම හා සිවිලිම, ආරුක්කු භාවිතය, කුළුණු භාවිතය, තරප්පු පෙළෙහි විශේෂතාවන් ආදී වශයෙන් අංග කිහිපයක් අධ්‍යයනයට බඳුන් වනු ඇත. අධ්‍යයනය සඳහා මා විසින් ප්‍රාථමික හා ද්විතීයික වශයෙන් දත්ත රැස් කිරීම සිදු කරනු ලබයි. ලබා ගන්නා දත්ත මත ඡායාරූප, සැලසුම්, උපයෝගී කර ගනිමින් වාස්තු විද්‍යාත්මක අධ්‍යනය සිදු කරනු ලබයි. නිබන්ධනය අවසානයේ දී ගොඩනැගිලිවල වාස්තු විද්‍යාත්මක සුවිශේෂතාවන්ට බලපවත්නා වූ බ්‍රිතාන්‍ය ගොඩනැගිලි ආකෘතීන් හා එම ආකෘතීන්ට අනුව මෙම ගොඩනැගිලි හතර තුළ තිබෙන්නා වූ බ්‍රිතාන්‍ය වාස්තු විද්‍යාත්මක අංග හා ඒ අතර පවත්නා දේශීය වාස්තු විද්‍යාත්මක සංකලනයන් අධ්‍යයනය කිරීම සිදුවේ. උරුමයන් වියැකී යන සමාජයක මෙවැනි උරුමයන් ආරක්ෂා කිරීම කාලෝචිත අවශ්‍යතාවක් වන්නේය. කාර්මීකරණය හා වාණිජකරණය හේතුවෙන් උඩරට පෞරාණික ගොඩනැගිලි බොහොමයක් අද වන විට විශාල වශයෙන් අභාග්‍යයට පත් වී හමාරය. එවැනි තත්වයක් හමුවේ සුළු වශයෙන් හෝ එම ගොඩනැගිලිවල පෞරාණිකත්වය අධ්‍යයනය කිරීම හා සටහන් කිරීම සඳහා ද මෙම අධ්‍යයනය වැදගත් වන්නේය.

ප්‍රමුඛ පද- වාස්තු විද්‍යාව, උඩරට, බ්‍රිතාන්‍ය යුගය, අධ්‍යයනය, ගොඩනැගිලි.

[1] පුරාවිද්‍යා විශේෂවේදී අවසන් වසර, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
Nadeeshadarshani20@gmail.com

[1] මහාචාර්ය, පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.